## ගල්ගමුව ප්‍රාදේශීය සභාව

### ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ III ශ්‍රේණියේ සෞඛ්‍ය කම්කරු (කොන්ත්‍රාත්) තනතුර සඳහා බඳවා ගැනීම

වයඹ පළාත් රාජ්‍ය සේවයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කම්කරු (කොන්ත්‍රාත්) තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරු (කොන්ත්‍රාත්) පිරිමි අයදුම්කරුවන් පමණි | 06 | දෛනික වැටුප් | රජයේ අනුමත පාසලකින් 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම ප්‍රමාණවත් වේ. |

*01. අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

II. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03ක් ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය. (පදිංචිය වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර සහාථ කර තිබිය යුතුය.)

III. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර, අනියම්, තාවකාලික, ආදේශක, ස්වේච්ඡා තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අදාළ නොවේ.

IV. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයෙන් විය යුතුය.

V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය :*

1. සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණ සහ ප්‍රායෝගික පරීක්ෂණ මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.
2. සම්මුඛ පරීක්ෂණට පැමිණෙන විට අයදුම්කරුවන් සියළුම සහතිකවල මුල් පිටපත් රැගෙන ආ යුතුය.
3. දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ ස්ථිර/තාවකාලික/අනියම්/ආදේශක/දීමනා/ස්වේච්ඡා පදනම මත සේවයේ නියුතු අයදුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
4. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.
5. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා සෞඛ්‍ය කම්කරුවන් වසරක කාලයකට හෝ අදාළ වෘත්තීය වැඩසටහන අවසන් වන තෙක් යන අවස්ථා දෙකෙන් පළමුව එළඹෙන අවස්ථාව දක්වා බඳවා ගැනේ.
6. සුදුස්සන් තෝරා ගැනීම පිළිබඳව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

1. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා සෞඛ්‍ය කම්කරුවන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක විය යුතුය.
2. මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව වයඹ ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, වයඹ පළාත් සභාව හෝ වයඹ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු බැඳී සිටී.



04. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2019.04.01 වැනි දින හෝ ඊට ප්‍රථම "ලේකම්, ගල්ගමුව ප්‍රාදේශීය සභාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
2. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුර සඳහන් කර අයදුම්පත එවිය යුතුය.
3. අයදුම්පත සමග පහත සඳහන් සහතිවල පිටපත් අමුණා එවිය යුතුය.

I. උප්පැන්න සහතිකය,

II. අධ්‍යාපන සහතික,

III. තම පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය,

IV. මෑතක දී ලබා ගත් චරිත සහතික 02ක්,

V. වෘත්තිය පළපුරුද්ද පිළිබඳ සහතිකය (රජයේ/පළාත් පාලන සේවයේ නියුක්ත වූවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය,

VI. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ගල්ගමුව ප්‍රාදේශීය සභාව.

2019 මාර්තු මස 08 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ දී ය.

### වයඹ පළාත් රාජ්‍ය සේවයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කම්කරු (කොන්ත්‍රාත්) තනතුර සඳහා අයදුම් පත්‍රය

01. i. අයදුම්කරුගේ මුලකුරු සමග නම :——————————
    ii. මුලකුරුවලින් හැඳින්වෙන නම:——————————

02. ස්ථිර ලිපිනය:——————————

03. i. උපන් දිනය : අවුරුද්ද :—————— මාසය :——————. දිනය:——————
    ii. 2019.04.01 වැනි දිනට වයස : අවුරුදු :—————— මාස :——————. දින :——————

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.

06. විවාහක/අවිවාහක බව :

07. ජාතිය :——————

08. වයඹ පළාත තුළ ස්ථිර පදිංචි කාලය :——————.

09. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :——————.

10. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වූ විභාග පිළිබඳ විස්තරය)
    i සමත් වූ වසර/ශ්‍රේණිය :—————— වර්ෂය :——————



ii. අ.පො.ස. (සා/පෙළ) විභාගය :

විභාග අංකය :——————. වර්ෂය :——————

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

iii. අ.පො.ස. (උ/පෙළ) විභාගය :

විභාග අංකය :—————— වර්ෂය:——————

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

11. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :——————.

12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තර:——————

13. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේ ද? :——————

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහෝ මා නුසුදුස්සකු බවට පත්වන බවටත්, තෝරාගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දන්වමි.

................................ ................................
දිනය අයදුම්කරුගේ අත්සන.

#### *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි.)

අයදුම්කරු ඉහත දන්වා ඇති තොරතුරු නිවැරදි බවත්, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදාහැරීමට එකඟ වන බවත්, දැනට .............................................. වශයෙන් සේවය කරන බවටත් සහතික කරමි.

................................ ................................
දිනය ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතුය.)

03-1150

Source: Government Gazette (2019.03.15)